# සරුංගල් හීනය



කතාව හා සිතුවම්

කායා විතානගේ

# සරුංගල් හීනය

## කායා විතානගේ

කතෘගේ වෙනත් කෘති

1) ගෙදර යුද්ධයක්

2) සරුංගල් හීනය

3) කුනු කන අලි

**කායා විතානගේ**

**මහාමායා බාලිකා විද්‍යාලය**

**මහනුවර**

**1 - D**

කෘතිය පල කරන දිනය 2025/02/08 Isbn IS37642

# <u>පිදුම</u>

**කතන්දර පොතක් ලියන්නට පළවෙනි අදහස ලැබුණේ මාක් අයියගෙන් මාක් අයියගේ කතන්දර පොත දැකලා.මගේ දෙවනි පොත මට ගොඩක් දිරිදෙන ඩොක්ටර් ඇන්ටිටත් මාක් අයියටත්.**

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

හැමදාම හවසට පුංචි කායා බැල්කනියට වෙලා අහසේ පාවෙන සරුංගල් දිහා බලනවා.

දිග නයි,පාට පාට කොටු සරුංගල් අහසේ පාවෙන කොට හරිම ලස්සනයි.



මටත් සරුංගලයක් ඕන. “අත්තේ මට සරුංගලයක් හදල දෙන්න.”

“මේ සරුංගල් යවන කාලේ නෙමෙයිනේ.”අත්තා කිවුවා.



පුංචි කායාගෙ උපන්දිනය.තෑගි ගොඩක් ලැබුණා.තෑගි අතර කායා හෙවුවේ සරුංගලයක් තියෙනවද කියලා.

බෝනික්කෝ,ටෙඩිලා,බෑග්,බෝතල් සෙල්ලම් බඩු පිරිලා.ඒත් සරුංගලයක් තිබ්බේ නෑ.




“අම්මේ,මට සරුංගලයක් අරන් දෙන්න.”

කායා ඉස්කෝලෙ යන ගමන් අම්මාට කිව්වා.

“හම්බුන තෑගි මදිද?” අම්මා ඇහුවා.



අම්මා එදා ටවුන් ගිහින්.සිලිමල්ලකුයි නූලකුයි ගත්ත කායා ටීචර් කියලා දුන්න විදියට පැරෂුට් එකක් හදන්න පටන් ගත්තා.



බැල්කනියේ හිටපු කායාට ලොකු සීතලක් දැණුනා.එකපාරටම වැස්ස පටන් ගත්තා.අයිස් වගේ සීතලයි. කායා නංගිත් එක්ක දුවලා දුවලා කාමරේට ගියා. බෙඩ්ෂීට් පොරවගෙන කොට්ට වලින් ඇඟ වහගත්තා.



මෙන්න බොලේ එකපාරටම නංගියි පුංචි කායායි සරුංගලයක් උඩට වැටුණා.පාවි පාවි ඈත අහසේ උඩට උඩටම ගියා.



මේ දෙන්නා කොච්චර උඩට ගියාද කියනවනම් ඉර මාමා ළඟටම ගියා.දැන්නම් පිච්චෙන්න හොඳටම ළඟයි.



අම්මෝ හොඳටම රස්නෙයි.අපිව පිච්චෙනවෝ.සරුංගලය කඩාගෙන නංගියි පුංචි කායායි බිමට වැටුනා.



අයියෝ මගේ කකුල් දෙක. කායා කෑගහගෙන ඇහැරුණා.කොට්ට වලින් කකුල් වහ ගත්ත කායාට හොඳටම නින්ද ගිහින්.හීනෙන් හරි සරුංගල් හීනය සැබෑ වුනානේ පුංචි කායා හිත හදා ගත්තා.



# කතුවරියගෙන් පණිවිඩයක්



මගේ පළවෙනි පොත ලියන්න මට උදව් වුනේ මගේ ආදරණීය නංගි. එයත් එක්ක ඉන්න හැටි තමයි මට මතක් උනේ. අපිට පෙනෙන අපිට දැනෙන දේවල් ගැන හිතුවහම ලස්සන දේවල් හිතෙනවා. ඒවා ලියන්න හරිම ලේසියි. ඒ හින්දා ඉස්සෙල්ලාම අපි අපේ ගෙදර ,අපේ මිදුල, අපේ වත්ත, අපේ පාසල වගේ දේවල් ගැන හිතලා ලියන්න පුරුදු වෙමු. එතකොට හරි ලේසියි මේ වගේ පුංචි කතන්දර පොත් ලියන්න.මේ පොත බලලා අම්මයි තාත්තයි මගේ මැඩම්ලයි හොඳයි කිව්වහම මට තව ආස හිතුනා ලියන්න.ඔන්න ඔයාලත් කතා පොත් ලියන්න පටන් ගන්න හොඳේ...

පොතක් ලියන්න මගපෙන්වූ අපේ විදුහල්පතිතුමියටත් අඩුපාඩු බලලා උදව්කල මගේ මැඩම්ලා හැමෝටමත් ගොඩක් ස්තුතියි!

කායා විතානගේ

මහාමායා බාලිකා විදුහල

මහනුවර

**1 - D**

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්